# සිංහල සිනමාවේ ගමන් මඟ





**පසුගිය** කලාපයේ මගේ ලිපියෙන් සිංහල සිනමාවේ ආරම්භය පිළිබඳ යම් කරුණු කීපයක් ඉදිරිපත් කළෙමි. 1947 ජනවාරි 21 වන දා තිරගත වූ කඩවුණු පොරොන්දුව චිත්‍රපටයේ සිට සිනමාවේ ගමන් මඟ පිළිබඳ අප සළකා බලමු.



මුල්ම සිංහල චිත්‍රපටය බිහිකරන්නට උත්සාහ කළේ විදේශිකයන් ය. ඔවුන් එසේ කළේ අපේ රටේ චිත්‍රපට කලාවක් බිහිකිරීමේ පරමාර්ථයෙන් නොවේ. හුදෙක් ආර්ථික වාසි සඳහා ය. විදේශීක චිත්‍රපට කරුවන් අතර ඒ යුගයේ දී තරගයක් ද විය. සිංහල ශිල්පීන්ගේ ආදාර උපකාර නොමැතිව ඔවුන්ට ජයගැනීමට නොහැකි බව මෙම තරගයට උර දුන් විදේහිකයන්ට වැටහුණි. ඔවුහු එම නිසා නිහඬ පිළිවෙතක් අනුගමනය කළහ. මෙම තරගය දෙස ඇස් කන් යොමා සිටි සිංහල කලා ශිල්පීන් කීප පොලක් සිංහල චිත්‍රපට කලාවක් බිහිකිරීමට වෑයම් කළ හ. මෙයට ඉහතදීත් නොයෙක් ආකාරයේ උත්සාහයන් ගත් බව අපට දැනගන්නට ඇත. ඒ අතරින් බී ඒ ඩබ් ජයමාන්න ශාන්ති කුමාර් සිරිසේන විමලවීර විලී ජයමාන්න ආදීන් සඳහන් කිරීමට පුලුවන.

ඒ කෙසේ වෙතත් මෙම කලා ශිල්පීන්ට තමන්ගේ අබිප්‍රාය ඉටු කර ගැනීමට නොහැකි වූයේ ආර්ථික දුෂ්කරතා නිසා ය. මේ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් විදේශික චිත්‍රපට නිෂ්පාදකයින් ඔවුන් ලවා චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සැළසුම් කළ හ. ඒ අතර එස් එම් නායගම් සර් චිත්තම්පලම් ගාඩිනර් වැනි අය මූලිකත්වය ගෙන චිත්‍රපට නිෂ්පාදනය සඳහා ශ්‍රී ලාංකික ශිල්පීන්ට මුදල් වියදම් කළ හ. ඒ අනුව බි ඒ ඩබ් ජයමාන්න එස් එම් නායගම් මහතාගේ නිෂ්පාදනය යටතේ කඩවුණා පොරොන්දුව චිත්‍රපටය නිෂ්පාදනය කළේ ය.



ක්‍රිස්ටි ලෙනාඩ් පෙරේරා

මෙසේ මෙම චිත්‍රපටය බිහිවීම.ත් සමඟම සිංහල චිත්‍රපට නිපදවීම සඳහා තරගයක්ආරම්භ විය. ඒ අනුව 1947 අප්‍රේල් 9 වන දා සර් චිත්තම්පලම් ගාඩිනර් නිපදවූ අසෝකමාලා තිරගත විය. එය අධ්‍යක්ෂණය කළේ ශාන්ති කුමාර් ය. මෙකළ චිත්‍රපට විශාල



රුක්මනී දේවි

සංඛ්‍යාවක් බිහිවිය. මෙම චිත්‍රපට දෙස බලා සිටි ශ්‍රී ලාංකික විචාරකයන් පැවසුවේ දකුණු ඉන්දියානු ඇටසැකිළි වලට සිංහලයන්ගේ මස් පුරවා ඒ ඇටසැකිළි පෙන්නූ බවයි. එසේ වීමට හේතු වූයේ එකල සියලු චිත්‍රපට රූපගත කළේ දකුණු ඉන්දියාවේ වීමත් නලු නිළියන් හැර සහභාගිවූ සියළුම ශිල්පීන් ඉන්දියානුවන් වීමත් ය. ඇඳුම් පැළඳුම් පසුතල දෙබස් උච්චාරන මේ සියලු දේ



## ශ්‍රීනාත් මද්දුමගේ

ඉන්දියානු චිත්‍රපට ආකාරයට දිස්වන්නට විය.

ඒ කෙසේ වෙතත් බී ඒ ඩබ් ජයමාන්න මහතා ඔහු නිෂ්පාදනය කළ ඔහුගේ ජනප්‍රිය නාට්‍ය එකිනෙක චිත්‍රපට ලෙස බිහිකළේ ය.



රේඛාව

එසේ ම ටවර් හෝල් යුගයේ ඉතාම ජනප්‍රිය නාට්‍ය අධ්‍යක්ෂවරයෙකු වන සිරිසේ විමලවීර මහතා ඔහුගේ ජනප්‍රිය නාට්‍ය ද චිත්‍රපට ලෙස නිපදෙව්වේ ය.

මේ කාලය වන විට ඉන්දියානු නිෂ්පාදකයන්ට අමතරව ශ්‍රී ලාංකික නිෂ්පාදකයන් ද බිහිවන්නට පටන් ගැනුනි. සිංහල චිත්‍රපට කලාවේ විහාල වෙනසක් සිදුකළ ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ රේඛාව වන තෙක් 1947 සිට තිරගත වූ චිත්‍රපට පහත දැක්වෙයි.

මෙම ලිපිය සැකසීමේ දී චිත්‍රපට නාමාවලිය හා තවත් විස්තර ලබාදුන් රෝහිත උඩවෙල මහතාට විශේෂ ස්තුතිය.

| | |
|---|---|
| කඩවුණු පොරොන්දු | 1947.01.21 |
| අසොකමාලා | 1947.04.09 |
| කපටි ආරක්ෂකයා | 1948.02.23 |
| දිව්‍ය ප්‍රේමය | 1948.06.04 |
| වැරදුණු කුරුමානම | 1948.08.12 |
| අම්මා | 1949.08.19 |
| පෙරලෙන ඉරණම | 1949.10.20 |
| ගම්බද සුන්දරී | 1950.02.17 |
| හදිසි විනිෂ්චය | 1950.05.26 |
| සීදේවි | 1951.03.09 |
| සැඟවුණු පිලිතුර | 1951.05.20 |
| බණ්ඩා නගරයට පැමිණීම | 1952.05.04 |
| උමතු විශ්වාසය | 1952.05.09 |
| සිරිසඟබෝ | 1952.07.19 |
| එදා රෑ | 1953.02.13 |
| ප්‍රේම තරගය | 1953.03.27 |
| පිටිසර කෙල්ල | 1953.04.24 |
| කැලෑ හඳ | 1953.05.27 |
| සුජාතා | 1953.04.26 |
| පුදුම ලේලි | 1953.12.04 |
| වරද කාගෙද | 1954.04.09 |
| අයිරාංගනී | 1945.04.10 |
| සරදියෙල් | 1954.08.05 |
| අහංකාර ස්ත්‍රිය | 1954.09.17 |
| රදල පිළිරුව | 1954.12.31 |
| සුරඟනී | 1955.02.10 |
| අසෝකා | 1955.03.04 |
| මතබේධය | 1955.04.13 |
| සැඩ සුළං | 1955.06.04 |
| මාතලන් | 1955.08.27 |
| පෙරකදෝරු බෑණා | 1955.10.14 |
| පොඩි පුතා | 1955.11.25 |
| දොස්තර | 1956.02.02 |
| ඩිංගිරි මැණිකා | 1956.05.11 |
| දෛව විපාකය | 1956.05.23 |
| දුප්පතාගේ දුක | 1956.08.18 |
| සුරතලී | 1956.06.19 |
| රම්‍යලතා | 1956.11.25 |
| රේඛාව | 1956.11.28 |

සූරිය
SOORIYA
ශ්‍රී ලාංකික ඔබේ වෙළඳසල
22 Lorne Street Lalor Vic 3075
Tel 03 9402 5380 Melway 9B6